P-10

## ශ්‍රී ලාංකික කාන්තා අයතිවාසිකම් ආරක්‍ෂා කිරීමේ යාන්ත්‍රණයක් ලෙස ජාතික කාන්තා කමිටුවෙන් ඉටුවන කාර්යභාරය පිළිබඳ විශ්ලේෂණාත්මක අධ්‍යයනයක්

එ. ශ. වී. කන්නන්ගර,

ආර්ථික විද්‍යා අධ්‍යයන අංශය, රුහුණු විශ්වවිද්‍යාලය, මාතර.

අයිතිවාසිකම්වල විශේෂ ලක්‍ෂණය වනුයේ පොදු බවයි. යම්කිසි අයිතිවාසිකමක් පොදු මනුෂ්‍යභාවයෙන් හටගන්නේ නම් එය මිනිස් අයිතිවාසිකමක් වේ. (ප්‍රනාන්දු, 1997 : 07). ස්ත්‍රී පුරුෂ සමානාත්මතාව සියලු මානව අයිතීන්වල පදනම වශයෙන් සැලකේ. ලිංගභේදය පදනම් කොටගෙන ස්ත්‍රී පුරුෂ වශයෙන් බෙදීමක් පැවතුන ද එම දෙපාර්ශවයම මානව ජීවීහු වෙති. එනම් කාන්තාව ද මානව පවුලේ සාමාජිකාවක වන්නීය. පුරුෂයාට හා සමාන අයිතියක් මානව අයිතිවාසිකම් භුක්ති විඳීමේ දී ඇයට ද හිමි වේ. එබැවින් කාන්තා අයිතීන් යනු විශේෂ හිමිකමක් නොවන අතර ඒවා මානව අයිතීන්ම වේ. එනිසා ස්ත්‍රී පුරුෂ භේදය අනුව වෙනස්කමකට ලක් නොවී සම අයිතිවාසිකම් භුක්ති විඳීමේ අවස්ථාව කාන්තාවට ද ලබා දීම වැදගත් වේ. කාන්තා අයිතිවාසිකම් සුරක්‍ෂිත කිරීමේ තත්ත්වය රටක සංවර්ධනය මැනීමේ දර්ශකයක් බවට ද අද පත්ව තිබේ. කාන්තා අයිතීන් සුරැකීම සඳහා සම්මුති, ප්‍රඥප්ති හඳුන්වාදීම, නීතිමය පද්ධතිය ශක්තිමත් කිරීම හා නොයෙකුත් ආයතන ස්ථාපිත කිරීමට රජය කටයුතු කර ඇත. ශක්තිමත් නීතිමය පද්ධතියක් පැවතිය ද ක්‍රියාත්මකභාවය තුළ පවතින අඩුලුහුඩුකම්, ආයතනයන්හි ක්‍රියාකාරීත්වය තුළ පවතින අඩුලුහුඩුකම් හේතුවෙන් ද කාන්තා අයිතිවාසිකම් නිසිලෙස සුරක්‍ෂිත නොවේ. (සාවිත්‍රි ගුණසේකර මහත්මිය සමඟ පැවැත්වූ සාකච්ඡාවක් ඇසුරිනි). එසේ වුවත් ලාංකික කාන්තාව හිමිකර ගත් ජයග්‍රහණයන් රාශියකි. කාන්තාවන්ගෙන් 90% ලිවීමේ, කියවීමේ හැකියාව ඇත. ශ්‍රම බලකායේ කාන්තා සහභාගීත්වය 33%කි. ජාතික ආදායමෙන් 60%ක් ම දායකත්වය ලැබෙන්නේ කාන්තාවන්ගෙනි. (සුමනසේකර, එස්. 2007:3). නමුත් සමාජය තුළ කාන්තාවන්ට අසමාන ලෙස සැලකිල්ල දක්වන බව පැහැදිලිය. දිනපතා පළවන පුවත්පත්, වාරික වශයෙන් පළවන සඟරා ආදිය තුළ දක්නට ලැබෙන ඇයගේ අයිතීන් උල්ලංඝනය වීමට අදාළ සිදුවීම් හරහා මේ බව තහවුරු වෙයි. ලංකාවේ කාන්තාවන්ට එරෙහිව පවත්නා වෙනස්කම් තවදුරටත් පවතින බව සැලකිල්ලට ගනිමින් ඇයගේ අයිතිවාසිකම් තහවුරු කිරීමට කාන්තා ප්‍රඥප්තිය සකස් කොට එහි දක්වූ අයිතිවාසිකම් කාන්තාවට ලබාදීමට කටයුතු කිරීමේ අරමුණ ඇතිව "ජාතික කාන්තා කමිටුව" ස්ථාපිත කර තිබේ. මෙම අධ්‍යයනයේ අරමුණ වූයේ කාන්තා කමිටුව විසින් කාන්තා අයිතිවාසිකම් සුරක්‍ෂිත කිරීම සඳහා දක්වූ දායකත්වය පරීක්‍ෂා කිරීමයි. කමිටුවේ සාමාජිකයන්ගෙන් අහඹු ලෙස තෝරාගත් 33%ක් වූ නියැදිය හා අදාළ කාලසීමාව තුළ කමිටුවෙන් සේවය ලබාගත් කොළඹ දිස්ත්‍රික්කයේ පදිංචි අයගෙන් අහඹු ලෙස තෝරාගත් 20%ක් වූ නියැදිය මඟින් ප්‍රශ්නාවලි සහ සම්මුඛ සාකච්ඡා තුළින් අවශ්‍ය ප්‍රාථමික දත්ත ලබා ගත්තේය. ද්විතීයික දත්ත ද උපයෝගී කරගෙන ලබාගත් තොරතුරු විස්තරාත්මකව විශ්ලේෂණය කරමින් අරමුණ සාධනය කර ගැනීමට වගු, ප්‍රස්තාර ආදිය යොදා ගෙන ප්‍රතිශතාත්මක ඇගයීමක් ද සිදු කළේය. කාන්තා ප්‍රඥප්තියේ සඳහන් අයිතිවාසකම් කාන්තාවන්ට ලබාදීමට කටයුතු කිරීමේදී ජාතික කාන්තා කමිටුව බොහෝ ගැටලුවලට මුහුණ දී සිටින බව අනාවරණය විය. කමිටුව මඟින් සැපයූ සේවාව පිළිබඳ ජනතාවගේ තෘප්තිමත්භාවය අවම මට්ටමක පැවති බවත්, කාන්තා අයිතීන් සුරැකීමේ දී ජාතික කාන්තා කමිටුවේ දායකත්වය අවම මට්ටමක පවතින බවත් නිගමනය කළේය.

මූලික පදයන් - අයිතිවාසිකම්, මානව අයිතිවාසිකම්, ස්ත්‍රී පුරුෂ සමානාත්මතාව, කාන්තා අයිතිවාසිකම්